www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද-ඕස්ට්‍රේලියා වෙලඳ ගනුදෙනුව: ලෝක වෙලඳ පොල "බෝල්කනීකරනය" කිරීමේ තවත් පියවරක්

## US-Australia trade deal: Another step in the “Balkanisation” of the world market

**නික් බීම්ස් විසිනි**
**2004 පෙබරවාරි 12**

පසුගිය සති අන්තයේ ප්‍රකාශයට පත් කල ඕස්ට්‍රේලියා - එක්සත් ජනපද නිදහස් වෙලඳ ගිවිසුම (ඒයූඑස්එෆ්ටීඒ) පිලිබඳව කීමට ඇති ප්‍රථම දෙය නම් එය වැරදි ලෙස නම් කෙරුනක් බව යි. මෙය නිදහස් වෙලඳ ගිවිසුමක් නොව අවසානයේ දී ලෝක වෙලඳ පොල සතුරු වෙලඳ කලාපයන් අතර බෙදා ලීමට තුඩු දෙන, ද්විපාර්ශ්වික හා කලාපීය වෙලඳ ගිවිසුම් පැන නැගීමේ වැඩෙන රටාවක කොටසක් වසයෙන් කෙරෙන වරනීය වෙලඳ ගනුදෙනුවකි.

මෙම ගනුදෙනුවේ සම්භවය පවතිනුයේ - සියැටෙල් (1999) හා කැංකුන් (2003) හි දී ලෝක වෙලඳ සංවිධානයේ රැස්වීම්වල බිඳ වැටීම හමුවේ - කලාපීය හා ද්විපාර්ශ්වික ගිවිසුම් රැක ගැනීමට එක්සත් ජනපදය විසින් දැරෙන, ක්‍රමයෙන් වැඩි වන තල්ලුව තුල ය. සුවිශේෂිතව, මෙම ගිවිසුමේ දී කර ඇතුවාක් මෙන්, අධි තාක්ෂනික නිෂ්පාදන හා සේවාවලට ප්‍රවේශවීමට මෙන් ම වැඩී යන ආයෝජන අවස්ථා ඩැහැ ගැනීමට ද එක්සත් ජනපදය උනන්දු වේ.

විශේෂයෙන් මිලිටරි හා ආර්ථික පෙරමුනුවල ක්‍රමයෙන් වැඩි වන ඇමරිකානු අත්තනෝමතික භාවය යටතේ එය සමග පෙර නො වූ විරූ සමීප සම්බන්ධතාවකට යාමට හොවාර්ඩ් ආන්ඩුව විසින් ගත් තීන්දුවක ප්‍රතිඵලයක් වසයෙන්, ඕස්ට්‍රේලියානු පාර්ශ්වය මෙම ගිවිසුමට එලඹියේ ය.

මෙම ගිවිසුම ප්‍රථමයෙන් සාකච්ඡාවට ගනු ලැබුවේ එක්සත් ජනපද පාර්ශ්වයෙන් බෝයිං, ඇල්කෝආ, එක්ස්සන්, මොබිල්, කොකාකෝලා, ජෙනරල් ඉලෙක්ට්‍රික් හා මැක්ඩොනල්ඩ් සමාගම් ද ඕස්ට්‍රේලියානු පාර්ශ්වයෙන් වයිසි වෙස්ට්ෆීල්ඩ්, ලෙන්ඩ් ලීස් හා නිව්ස් ලිමිටඩ් ද යන දෙරටේ මහා ව්‍යාපාරික අවශ්‍යතාවන්ගේ සභාගයක් මගිනි. 2002 ජනවාරියේ නිදහස් වෙලඳ ගිවිසුමට සහාය පල කරමින් නිව් යෝක් හි පැවති ව්‍යාපාර නායකයන්ගේ ඉහල පෙලේ රැස්වීමකට හොවාර්ඩ් සහභාගි විය. මෙහි මුලසුන දැරුවේ මාධ්‍ය හිමිකරුවෙක් වන රූපට් මර්ඩොක් ය.

ගනුදෙනුවට පිටුබලය දුන් ව්‍යාපාරික හා භූ-දේශපාලනික ප්‍රශ්න, ගිවිසුමේ කේන්ද්‍රීය සංරචකයන් තුල ද එය ප්‍රකාශයට පත්වීම කෙරෙහි ලත් ප්‍රතිචාර තුල ද පිලිබිඹුව ඇත.

ඒයූඑස්එෆ්ටීඒ හි වැදගත් ලක්ෂනයන්ගෙන් එකක් වන්නේ සීනි සම්බන්ධයෙන් කිසිදු සහනයක් දීම, එක්සත් ජනපදය විසින් ප්‍රතික්ෂේප කොට තිබීම යි. සාකච්ඡා පැවති 2003 වසර මුලුල්ලේ ම ඇමරිකානු සීනි වෙලඳ පොලට ප්‍රවේශ වීමට ඉඩ ලබාදීම ගැන ගිවිසුමෙහි අන්තර්ගත විය යුතු යැයි ඕස්ට්‍රේලියානු ආන්ඩුවේ ඇමතිවරු අවධාරනය කලහ; නියෝජ්‍ය අගමැති ජෝන් ඇන්ඩර්සන් කියා සිටියේ සීනි ප්‍රශ්නය ඉවතලන්නේ නම් ගිවිසුම "ඕස්ට්‍රේලියානු - නො වන" එකක් වනු ඇති බව යි.

එහෙත් ගනුදෙනුව ප්‍රකාශයට පත් වූ විට, ඕස්ට්‍රේලියානු නිෂ්පාදකයන්ට වැඩිපුර එක් සීනි කැටයක්වත් නො ලැබිනි. ඔවුන් වසරකට වැඩිපුර සීනි ටොන් මිලියන 2.6ක් දක්වා ප්‍රමානයක් විකිනීම කෙරෙහි බලාපොරොත්තු තැබුව ද එක්සත් ජනපද වෙලඳ පොලට දිගට ම ඔවුනට යැවිය හැකි වන්නේ පෙර මෙන් ම වසරකට ටොන් 87,000ක් පමනි - එය එක්සත් ජනපදයේ එක් දිනක මුලු පරිභෝජනයටත් අඩු ප්‍රමානයකි. මැතිවරන වර්ෂය තුල, බුෂ් පරිපාලනය, සීනි නිපදවන ෆ්ලොරිඩා, ලුසියානා, උතුරු ඩැකෝටා හා මිනෙසෝටා ප්‍රාන්තවල විරෝධයට පාත්‍රවීමේ අනතුර දරාගන්නට සූදානම් නැත.

ඕස්ට්‍රේලියානු කෘෂිකර්මය සම්බන්ධයෙන් සුලු ජයග්‍රහන කිහිපයක් - ඊලග වසර 18 තුල එක්සත් ජනපදය හරක් මස් ආනයනය කිරීමේ සලාකයන් ක්‍රමයෙන් ඉවත් කරනු ඇත. එහෙත් මෙය ආරම්භ කරනුයේ එක්සත් ජනපදයේ අපනයනයන්, මෑත දී පැතිරුනු පිස්සු ගව රෝගයට පෙරාතුව පැවති මට්ටමට නැගුනු පසු වසර තුනක කාලයකිනි. එමෙන් ම ගෙවතු නිෂ්පාදනත්, බැටලු මස් හා සකස් කල ආහාර සඳහාත් සමහර සහන පිරිනමා ඇත - ලබා දී ඇත ද එක්සත් ජනපදයේ කෘෂිකාර්මික වෙලඳ පොලට ඇතුලුවීමට සීමාවන් පෙර සේ නොවෙනස්ව ම වාගේ පවතී.

සිය ආන්ඩුවේ පොරොන්දු එසේම තිබිය දී ද සීනි නිපදවන උතුරු ක්වීන්ස්ලන්තයේ ඡන්ද අඩුවිය හැකි වුව ද හොවාර්ඩ් හා ඔහුගේ ඇමතිවරු මෙම ගිවිසුම

දිගට ම ගෙන යා යුතු යැයි තීරනය කලහ.

අගමැති මෙම ගිවිසුම "පරම්පරාවකට වරක් ලැබෙන අවස්ථාවක්" හැටියට වර්නනා කරමින් උක් ගොවීන්ට වඩා බෙහෙවින් වැදගත් බලවේගයන්ගේ බලපෑම් සිය ආන්ඩුවට එල්ල වී ඇති බව ද ඒ සමග ම පැහැදිලි කර ඇත.

මීට පෙර විශේෂයෙන් ම ගම්බද සුවිශේෂී අවශ්‍යතාවන් හමුවේ නිදහස් වෙලඳ පොල න්‍යාය පත්‍රය ක්‍රියාවට නැගීමට අඩු අවධානයක් යෙදීම ගැන මර්ඩොක් ට අයිති මාධ්‍යයන්ගෙන් එල්ල වූ විවේචන හමුවේ ගිවිසුමට සීනි වෙලඳාම ඇතුලත් නො වීමේ හේතුව මත එය ප්‍රතික්ෂේප කිරීමෙන් මහා ව්‍යාපාරිකයන් වෙතින් එල්ල විය හැකි සතුරු ප්‍රතිචාරයන්ගේ අවදානම ගැනීමට හොවාඩ් සූදානම් නො වී ය.

"කොයි හැටියකින් වත් වෙලඳාමේ හා ආයෝජනයේ සම්ප්‍රදායික රටාවන්හි වැදගත්කම අඩු නො වූව ද, අනාගතය අපේ සේවා අංශවල හා නිෂ්පාදන කර්මාන්තවල ප්‍රසාරනය මත බෙහෙවින් බැඳී ඇතැ" යි ඔහු ප්‍රකාශ කලේ ය.

මෙම සේවා හා නිෂ්පාදන සමාගම්වලින් සමන්විත ප්‍රධාන ව්‍යාපාරික සමාගම් එකවරම මෙයට එකඟ වූහ. මෙම ගිවිසුම (ඒයූඑස්එෆ්ටීඒ) ඕස්ට්‍රේලියානු ව්‍යාපාරවලට "ලෝකයේ වඩාත් ක්‍රියාශීලි හා නව්‍ය වූ ආර්ථිකයන්ගෙන් එකක්" තුලට නව ප්‍රවිෂ්ඨයන් ලබා දෙනු ඇතැයි ඕස්ට්‍රේලියානු වානිජ හා කර්මාන්ත මන්ඩලය ප්‍රකාශ කලේ ය.

ගිවිසුම සාර්ථක කර ගැනීමට ක්‍රියා කරමින් සිටි ප්‍රමුඛ සමාගම් 100කින් සමන්විත ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාර කවුන්සලයේ සභාපති, හියු මෝර්ගන්ගේ සංවිධානය මේ ගැන වඩාත් උද්යෝගිමත් විය. ඔහු කියා සිටියේ ගිවිසුමට අත්සන් තැබීම ඕස්ට්‍රේලියාවට "ඓතිහාසික මොහොතක්" බව යි. එය ලෝකයේ ලොකුම වෙලඳ පොලට ප්‍රවේශවීමට - විශේෂයෙන් මෙතෙක් විදේශ කොම්පැනිවලට පනවා තිබූ මූල්‍ය බාධක හේතුවෙන් විශාල වසයෙන් ඕස්ට්‍රේලියානු සමාගම්වලට පිවිසිය නො හැකි ව තිබුනු වටිනාකම ඩොලර් බිලියන 270ක් වූ එක්සත් ජනපද මධ්‍යම ආන්ඩුවේ සැපයුම් වෙලඳ පොලට - ඕස්ට්‍රේලියානු සමාගම්වලට "දැවැන්ත අවස්ථාවන්" විවර කර දෙනු ඇති බව ඔහු කී ය.

විදේශ කටයුතු හා වෙලඳාම පිලිබඳ දෙපාතමේන්තුවේ (ඩීඑෆ්ටීඒ) විවරනයන් තුල, පුළුල් භූ-දේශපාලනික ප්‍රශ්න - විශේෂයෙන් ම ප්‍රමුඛ ආර්ථික බලවේගයන් වන යුරෝපය හා එක්සත් ජනපදය අතර වෙලඳ යුද්ධයේ දී ඕස්ට්‍රේලියාවේ ආස්ථානය පිලිබඳව සලකා බැලීම - පිලිබිඹුව ඇත්තේ ය. ගනුදෙනුව පිලිබඳ සිය සමීක්ෂනයේ නිගමන තුල දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර ඇත්තේ මෙසේ ය. "ඕනෑම අනාගත භූගෝලීය ආරක්ෂක ක්‍රියාවන් (මෙය තීරු බඳු, කෝටා හා අනෙකුත් සීමාකිරීම් වැනි පියවර සඳහා වක්‍රව යෙදුනු වචනයකි.) සම්බන්ධයෙන් නිදහස් වෙලඳ ගිවිසුමක කොටස්කරුවකු වසයෙන් දැන් ඕස්ට්‍රේලියාව වඩා හොඳ තත්වයක් ලබා ඇත්තේ ය. - එනම් වානේ හා බැටලුවන් සම්බන්ධයෙන් කැනඩාවට ලැබී ඇති ආකාරයේ - නිරායාසයෙන් ම වාගේ ආරක්ෂක සීමාවන්ගෙන් අප නිදහස් කෙරෙනු ඇත."

මෙම ප්‍රශ්නය පිලිබඳව *ඕස්ට්‍රේලියන්* පුවත් පතේ විදේශ කටයුතු පිලිබඳ කර්තෘ වන ග්‍රෙග් ෂෙරිඩන් ද ලියා ඇත. මෙම ගිවිසුම (ඒයූඑස්එෆ්ටීඒ) "අනාගත එක්සත් ජනපද ක්‍රියාවන්ට එරෙහිව ගැඹුරු ආරක්ෂක රැකවරනයක් හෝ, ඇත්තෙන් ම භූගෝලීය නිදහස් වෙලඳාමේ අවුල් නිරවුල් කිරීමක් ද" ඉදිරිපත් කරතැ යි ඔහු කී ය.

## ඕස්ට්‍රේලියානු පාලක කවයන් තුල බෙදීම්

හොවාර්ඩ් ආන්ඩුවට, මෙම වෙලඳ ගිවිසුම හා ඉරාකයට එරෙහි එක්සත් ජනපද යුද්ධයට සම්බන්ධවීමේ තීන්දුව එක ම මූලෝපායික යොමුවක කොටස් දෙකක් පමනි. ඇත්තෙන් ම 2002 නොවැම්බරයේ දී ඒයූඑස්එෆ්ටීඒ ගිවිසුම උද්යෝගයෙන් ඉදිරියට ගෙන යාමේ තීන්දුවට එලඹුනේ, එක්සත් ජාතීන්ගේ මොනයම් ම එකඟතාවකින් හෝ තොරව ඉරාකයට එරෙහි එක්සත් ජනපද මිලිටරි ආක්‍රමනයට සහයෝගය දැක්වීමට හොවාර්ඩ් ආන්ඩුවේ කොන්දේසි විරහිත කැපවීමෙන් සති ගනනක් තුල ය.

එහෙත් හොවාර්ඩ්ගේ "ඇඑජ සමග එකදිගට" යන විදේශ ප්‍රතිපත්තියේ ප්‍රඥා මහිමය ගැන පාලක පන්තියේ ඇතැම් කොටස් තුල යම් මට්ටමක කනස්සල්ලක් පැවතුනි මෙය ඒයූඑස්එෆ්ටීඒ පිලිබඳ මාධ්‍ය ආවරනයන්හි පිලිබිඹුව තිබුනි.

යුද්ධයට සහයෝගය දුන් මර්ඩොක්ගේ මාධ්‍ය සිය ස්ථාවරය වෙනස් නො කලේ ය. *ඕස්ට්‍රේලියන්* පුවත් පතේ මුල් පිටුවේ කතාවට මෙසේ මුල පිරී ය. "නිෂ්පාදන හා සේවා අංශයන්ට වාසිදායක අවස්ථා පිරිනමන ඓතිහාසික වෙලඳ ගිවිසුමක් යටතේ, ඕස්ට්‍රේලියාවේ අනාගත උවමනාවන් එක්සත් ජනපදය හා තව දුරටත් සම්බන්ධ කිරීමට හොවාඩ් ආන්ඩුව කටයුතු කර තිබේ."

ඊට සාපේක්ෂව, ඉරාකයට එරෙහි යුද්ධයට සුලු විරෝධයක් පලකල *සිඩ්නි මෝනිං හෙරල්ඩ්* පුවත් පත එහි මුල් පිටුවේ සිරස්තලය ලෙස "එක්සත් ජනපදය, වෙලඳ ගනුදෙනුවේ වාසිය ගනී" යනුවෙන් ලිවූ අතර ගිවිසුඅම (ඒයූඑස්ටීඒඑෆ්ඒ) ඕස්ට්‍රේලියාවට වඩා ඇමරිකාවට යහපත්" බව ප්‍රකාශ කලේ ය. එහි තීරු රචකයකු වන ටොම් ඇලර්ඩ් විස්තර කලේ එක්සත් ජනපදය සමග කල සාකච්ඡාවන් ප්‍රබල ඇමරිකානුවාදය වෙතට හොවාර්ඩ් ආන්ඩුවේ නැමීම හා ද්විපාර්ශ්වික වෙලඳ ගනුදෙනු කෙරෙහි එය දක්වන අවධානයත් පිලිබඳ පරීක්ෂනයක් බව යි. "එම කරුනු දෙකටම ආන්ඩුවේ ප්‍රවිශ්ඨයේ, ප්‍රඥාගෝචර භාවය පිලිබඳව ගිවිසුමෙන් බැරෑරුම් ප්‍රශ්න මතු කර තිබේ."

ඇලර්ඩ් පෙන්වා දෙන්නේ ඉරාක යුද්ධයට ඕස්ට්‍රේලියාවේ සහභාගිත්වය වත් බුෂ් සමග හොවාර්ඩ්ගේ ඇති සමීප බැඳීම් වත් ගිවිසුමේ දී "කිසිදු ගනනකට නො ගෙන" ඇති බව යි. එක්සත් ජනපදය විසින් සිංගප්පූරුව, චිලිය හා මධ්‍යම ඇමරිකානු රටවල් හයක් සමග ඇති කර ගත් ගිවිසුම් සියල්ල, එම කිසිදු රටක් හමුදා දායකත්වයක් ලබා නො දුන් නමුදු, ඕස්ට්‍රේලියාවට ලැබුනාට වඩා වැඩි යමක් ලබාගෙන ඇති බව ද ඔහු සඳහන් කරයි.

පුවත් පත් දෙකෙහි කතුවැකි තුල ද මෙම වෙනස්කම් පිලිබිඹු වී තිබින. *ඕස්ට්‍රේලියන්* හි කතුවැකිය, ගිවිසුමට "ජයසෝසා දෙකක්" දුන් අතර ඕස්ට්‍රේලියාව හා එක්සත් ජනපදය අතර "යුද ගිනිමැලය තුල පන්නරය ලැබූ" ජාතික සුරක්ෂිතතාවේ, ආරක්ෂාවේ හා සංස්කෘතික බැඳීම්වල ශක්තිය පෙන්වා දෙනු ලැබී ය. එය අවසන් කර තිබුනේ මෙම ගිවිසුමට බාධාකාරී වන කිසිදු දෙයක් කිරීමට ප්‍රථම ලේබර් පක්ෂය "ඉතා ගැඹුරින් සිතා බැලිය යුතු" බවට අවවාද කරමිනි. තව ද නිදහස් වෙලඳාම පිලිබඳව සිය ප්‍රකාශිත එකඟතාව ඉදිරියට ගෙන යන ලෙසත්" "ගිවිසුමේ වගන්තිවලින් තම අපේක්ෂා බිඳී ඇති නමුදු, සෙනෙට් සභාවේ දී තමා කටයුතු අවුල් නො කරන බව ප්‍රකාශ කිරීම මගින් ලේබර් පක්ෂයට ඔහු යථා වසයෙන් නායකත්වය දෙන බව පෙන්වා ලන" ලෙසත් නව ලේබර් නායක මාක් ලේකම්ගෙන් ඉල්ලා සිටියි.

අනෙක් අතට, *සිඩ්නි මෝර්නිං හෙරල්ඩ්* පුවත් පත සිය කතුවැකිය මගින් අවධාරනය කලේ ගිවිසුම (ඒයූඑස්එෆ්ටීඒ) පිලිගන්නේ ද නැද්ද යන්න තීරනය කල හැක්කේ "එහි සම්පූර්න විස්තර විමර්ශනයකට විවෘත වූ විටෙක" පමනි.

විස්තර ප්‍රකාශයට පත්වීමට පූර්වයෙන් පවා ගිවිසුම යතා වසයෙන් කුමක් ගෙන එන්නේ ද යන ප්‍රශ්න පැවතුනි. ඕස්ට්‍රේලියාව පැත්තෙන් ප්‍රමුඛ ප්‍රශ්නයක් වූයේ නිෂ්පාදන භාන්ඩ සඳහා එක්සත් ජනපද වෙලඳ පොලට ප්‍රවේශවීම ය. එහෙත් මෙම භාන්ඩවලට ගිවිසුමේ ප්‍රතිලාභ ලැබෙනු ඇත්තේ ඒවා ඊනියා "ප්‍රභවය පිලිබඳ නීති" වලින් ගොඩ ආවේ නම් පමනි. ගිවිසුම යටතේ ඕස්ට්‍රේලියානු නිෂ්පාදනයකට එක්සත් ජනපද වෙලඳ පොලට ඇතුලු විය හැක්කේ එහි ඕස්ට්‍රේලියානු හෝ එක්සත් ජනපද උපාංග යම්නිශ්චිත ප්‍රමානයකට වඩා අඩංගු නම් පමනකි.

1980 ගනන්වල හෝක්ගේ ලේබර් ආන්ඩුවේ විටෙක ආර්ථික උපදේශක වූ ද දැන් ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා මහාචාර්යවරයකු වූ රොස් ගානොට්ගේ ලිපියකට අනුව මෙම "ප්‍රභවය පිලිබඳ නීති" උතුරු ඇමරිකානු නිදහස් වෙලඳ ගිවිසුමට (එන්ඒඑෆ්ටීඒ) සමාන ආකාරයෙන් යෙදුනේ නම්, එවිට "බොහෝ ඕස්ට්‍රේලියානු නිෂ්පාදනවල විශාල වසයෙන් නවසීලන්ත, ආසියානු හා යුරෝපීය සංරචක (කොටස්) අඩංගු වනු ඇති බැවින් ඒවා බැහැර කෙරෙනු ඇත." මෙහි තේරුම වනු ඇත්තේ ඕස්ට්‍රේලියානු නිෂ්පාදකයන්, ගිවිසුමේ (ඒයූඑස්එෆ්ටීඒ) ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබනු වස් නවසීලන්ත හෝ ආසියානු සැපයුම්කරුවන්ගෙන් ඉවතට හැරී ඕස්ට්‍රේලියාවෙන් ම හෝ එක්සත් ජනපදයෙන් අවශ්‍ය සංරචකයන් ලබා ගැනීමට පෙලඹෙනු ඇති බව යි.

යක්ෂයා ලැගුම් ගත් තවත් ක්ෂේත්‍රයක් වන්නේ ලැයිස්තු ගත අනුමත ඖෂධ සහනදායී මිලකට දෙනු ලබන ඖෂධ ආධාර වැඩපිලිවෙල (පීබීඑස්) යි. බලගතු එක්සත් ජනපද ඖෂධ සමාගම් සාකච්ඡාවල දී ඉල්ලා සිටියේ වඩ වඩාත් මෙම වැඩපිලිවෙලට ප්‍රවේශවීමට අවස්ථාව දෙන ලෙස ය. ඕස්ට්‍රේලියානු ආන්ඩුවේ සාකච්ඡාකරුවන් අවධාරනය කලේ ඖෂධ ආධාර වැඩපිලිවෙලට (පීබීඑස්) අත නො තැබිය යුතු බව ය; ඔවුහු මෙම ප්‍රකාශය, ගිවිසුම පිලිබඳව මහජනතාව වෙත නිකුත් කල නිවේදනයේ පුන පුනා සඳහන් කලහ.

එහෙත් එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියානු තක්සේරු කිරීම්වල පැහැදිලිව පෙනෙන වෙනස්කම් තිබින. එක්සත් ජනපදය අවසන් නිගමනවලින් කියා සිටියේ ඖෂධ ආධාර වැඩපිලිවෙල වැඩි දියුනු කල යුතු බව යි. "විනිවිදභාවයේ හා වගකීමට බැඳීමේ ප්‍රවර්ධනයක් ඇති කරන ඖෂධ ලයිස්තුගත කිරීම් විමසුනය කිරීමට ස්වාධීන විමර්ශන ක්‍රියාවලියක් ඇති කිරීම ඊට ඇතුලත්" වන බව යි. එබඳු ක්‍රියාවලියකින් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රතික්ෂේප කිරීමේ තීරන වෙනස් කිරීමේ හැකියාව තමන්ට ලැබෙනු ඇතැයි එක්සත් ජනපද ඖෂධ සමාගම් බලාපොරොත්තු වේ.

ඖෂධ ආධාර වැඩපිලිවෙල ගැන ඕස්ට්‍රේලියානු ආන්ඩුවේ ප්‍රකාශය විස්තර අඩු කෙටි එකක් විය. එයින් කියා සිටියේ "විනිවිද භාවය හා කලට වේලාවට ක්‍රියා කිරීම" වැඩිදියුනු කල යුතු බවත් නව ඖෂධ, නාමාවලියට ඇතුල් කිරීමට අවශ්‍ය සමාගම්වලට ඒ ක්‍රියාවලියට පිවිසිය හැකි" බවත් පමනි.

ඕස්ට්‍රේලියානු පාරිභෝගික සංගමයේ සෞඛ්‍ය ප්‍රතිපත්ති පිලිබඳ නිලධාරී මාටින් ගොඩාර්ට අනුව, පීබීඑස් සඳහා වූ අභියාචනා ක්‍රියාවලියක් පිරිවැය ඉහල නංවන "ව්‍යසනයක" බව යි. ඔහු *ඕස්ට්‍රේලියන් ෆිනෑන්ෂල් රිවීව්* පුවත් පතට මෙසේ පැවසී ය. "සමාගම් අකමැති වන සෑම තීන්දුවකට එරෙහිව දැන් අභියාචනා ක්‍රියාවලියකට පැටලීමට සිදුවනු ඇත. එච්අයිවී ප්‍රතිකාරක ඖෂධ ද ඇතුලත් නව ඖෂධ ලබා ගැනීමට ඕස්ට්‍රේලියානු රෝගීන්ට මාස ගනන් හෝ අවුරුදු ගනන් බලා සිටීමට සිදුවනු ඇත. පීබීඑස් හි පිරිවැය සැබවින් ම වැඩි වනු ඇත."

මාධ්‍ය පාලනය කෙරෙන නීති රෙගුලාසි අඩංගු ක්ෂේත්‍රය ද මතභේදයට තුඩු දී ඇත. පසුගිය දෙසැම්බරයේ නලුනිලියන්, චිත්‍රපට නිෂ්පාදකයන් හා ශිල්පීන් එක්සත් ජනපදය සමග කෙරෙන ඕනෑම නිදහස් වෙලඳ ගිවිසුමකින් ඕස්ට්‍රේලියාවේ "සංස්කෘතික අනාගතය" ආරක්ෂා කර ගත යුතු යැයි ඉල්ලා විරෝධතාවක් සංවිධානය කලහ. ගිවිසුම මගින් දේශීය "මාධ්‍ය නීති" හැසිරවීමේ බලය ඕස්ට්‍රේලියානු ආන්ඩුව

අතේ ම පවතිනු ඇතැයි වෙළඳ ඇමති මාක් වයිලේ ප්‍රකාශ කලේ ය. කෙසේ වෙතත් එක්සත් ජනපද වෙළඳ නියෝජිත බොබ් සෝඑලික් අවධාරනය කලේ එක්සත් ජනපද සමාගම්වලට ලැබී ඇති වැඩි වූ අවස්ථා ගැන ය. "එක්සත් ජනපද චිත්‍රපට හා රූපවාහිනී වැඩසටහන් සඳහා කේබල්, චන්ද්‍රිකා හා අන්තර්ජාලය ඇතුලු විවිධ මාධ්‍යයන්ට වෙළඳ පොල ප්‍රවේශයන් වැඩි කරන" වැදගත් වූත් පෙර නො වූ විරූ වූත් විධි විධාන නිදහස් වෙළඳ ගිවිසුමේ අන්තූගත වේ" යැයි ඔහු කී ය.

## වරනීය වෙළඳ ගිවිසුම්වල ඉහල යෑමක්

ඕස්ට්‍රේලියාව තුල එලඹෙන සති හා මාසවල දී කෙරෙන ඒයූඑස්ටීඒඑෆ්ඒ පිලිබඳ විවාදය, එමගින් ලැබෙන ප්‍රතිලාභ "අපට" ගෙවීමට සිදුවන මිලට වඩා අගයෙන් වැඩි ද අඩු ද යන්න මත කේන්ද්‍රගත කෙරෙනු ඇත. එහෙත් එහි යථා වැදගත්කම හුදෙක් පටු, ජාතික රාමුවක දෘෂ්ටියෙන් බලා වටහා ගත නො හැකි ය. සත්‍ය ඇගයීමක් කල හැකි වනුයේ ගනුදෙනුව එහි භූගෝලීය සන්දර්භය තුල පිහිටුවීමෙන් පමනකි. එවිට ඒයූඑස්එෆ්ටීඒ යනු පලල් සන්තතියක පුංචි කොටසක් පමනක් බව පෙනී  යනු ඇත.

ලෝක වෙළඳ සංවිධානයට (ඩබ්ලිව්ටීඕ) අනුව, එහි සාමාජිකයන්ගෙන් බහුතරය - මීට දශකයකට හෝ ඊට පෙර පැවති තත්වයට වෙනස් ව - කලාපීය හෝ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් එකක හෝ වැඩි ගනනක කොටස්කරුවෝ වෙති. එබඳු ගිවිසුම් 170කට වඩා ඇති අතර තවමත් ලෝවෙස ට වාර්තා නො කෙරුන ද, අතිරේක ගිවිසුම් 70 ක් ක්‍රියාත්මකව පවතී. තව ද එබඳු ගිවිසුම්වලට එලඹීමේ වේගය වැඩිවෙමින් පවතී. 2005 අවසානය වන විට කලාපීය ගිවිසුම් 300ක් පමන ක්‍රියාවේ යෙදෙනු ඇත. මෙහි අර්ථය වනුයේ ලෝක වෙළඳාමෙන් හරි අඩකට වඩා සිද්ධ වනු ඇත්තේ නිදහස් වෙළඳ ගිවිසුම්වලින් බැඳෙන රටවල් අතර බව ය. - එය 2000 වර්ෂයේ පැවතියේ සියයට 43.2 මට්ටමක ය.

මෙම වේගවත් වර්ධනයේ අර්ථභාරය මතු වන්නේ - විශේෂයෙන් 1930 ගනන්වලින් මෙහා පැත්තට අන්තූ ජාතික වෙළඳාමේ ඉතිහාසය සැලකිල්ලට ගත් විට ය.

පශ්චාත් යුද කාලීන වෙළඳ හා මූල්‍ය සැලසුම්වල නිර්මාතෘන් - රූස්වෙල්ට් යටතේ නිව් ඩීල් ආර්ථික විද්‍යාඥයන්ගෙන් හා ජෝන් මේනාඩ් කේන්ස් නායකත්වය දුන් බ්‍රිතාන්‍ය ආර්ථික විද්‍යාඥයන් - විනාශකාරී ආරක්ෂනවාදයත් 1930 ගනන්වල පැවති අසල්වැසියා හිඟමනට දැමීමේ පිලිවෙතත් වෙනුවට නිදහස් වෙළඳාමේ වැඩසටහනක් ඉදිරියට ගෙන ආවේ යැයි සමහර විට කියනු ලැබේ.

එය පාර්ශ්වීය වසයෙන් පමනක් සත්‍ය ය. නිදහස් වෙළඳාම ගැන කෙරෙන අවධාරනය තිබිය දී ම තීරුබදු හා ආරක්ෂනයේ අනෙකුත් රූපාකාරයන් තවමත් පශ්චාත්-යුදකාලීන වෙළඳ වාතාවරනයේ කොටසක් ව තිබිනි. 1930 ගනන්වල අත්දැකීමෙන් උකහා ගත් කේන්ද්‍රීය පාඩම වූයේ, නිදහස් වෙළඳාමේ මට්ටම කුමක් වුව ද වරනීය ගනුදෙනු හා ගිවිසුම්වලට නැවතීමක් තැබිය යුතු බව යි. එනම් තීරුබදු පනවන්නේ නම් එය සියලු කන්ඩායම්වලට එක සේ බලපෑ යුතු බව යි. එමෙන් ම තීරුබදු අඩු කරන්නේ නම් හා සීමා කිරීම් ඉවත් කරන්නේ නම් මෙම නව පියවරයන් සියලු වෙළඳ ජාතීන්ට එක සේ අදාල විය යුතු ය.

1930 ගනන්වල දක්නට ලැබුනු ආර්ථික හා අනවශ්‍ය මිලිටරි ගැටුමකට ආපසු යෑම වලකාලීමට තීරනාත්මක යැයි සලකනු ලැබූ, මෙම මූලධර්ම වේගයෙන් අතහැර දමනු ලැබෙමින් පවතී. ද්විපාර්ශ්විකවාදය, කලාපීයවාදය හා ගනුදෙනු තවදුරටත් ව්‍යතිරේඛයක් නො ව, වරනීය සිද්ධාන්තයක් බවට වේගයෙන් වෙනස් වෙමින් තිබේ.

පසුගිය වසරේ නොවැම්බර් 12 දා *ඒෂියා ටයිම්ස්* පුවත් පතට හිටපු ක්ලින්ටන් වෙළඳ නියෝජිත චාර්ලින් බාර්ෂෙව්ස්කි කල සඳහනකට අනුව "1930 ගනන්වල ප්‍රතිපත්ති සම්පාදනය කරා ආපසු යාමක්" සිදු නො වන අතරේ ම "අලංකාරෝක්ති එන්න එන්න ම කැත කුනු වෙමින් පවතී." වරනීය ගිවිසුම් මගින් "දූපත් හෝ දූපත් ආර්ථික ඒකක සමූහයක්" නිර්මානය කෙරෙන අතර "භූගෝලීය ආර්ථිකය තව දුරටත් බෝල්කනීකරනය" වීමේ අනතුර ඉස්මතු කරයි.

ඕස්ට්‍රේලියා - එක්සත් ජනපද නිදහස් වෙළඳ ගිවිසුමේ (ඒයූඑස්එෆ්ටීඒ) වැදගත්කම පවතින්නේ මෙහි ය. මෙම ගිවිසුම, ඉතිහාසය පෙන්වා දී ඇති පරිදි, යුද්ධයක ප්‍රාරම්භය වීමට හොඳින් ම ඉඩකඩ සලසන, එකිනෙකට සතුරු වෙළඳ කන්ඩායමක හැඩගැසී ඒමට තුඩු දෙන, ලෝක වෙළඳ පොල සම්බන්ධයෙන් වූ ගැඹුරු වන ගැටුම්වල නවතම ප්‍රකාශනය වන්නේ ය.

© www.wsws.org